# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2065/31 - 2018 අප්‍රේල් මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2018.04.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : 47/2017, කේඩීඑස්/කේජීකේ/4/2/3/8-පොදු.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/7/2016/එච්ඩබ්ලිව්/151.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත්සතර හා ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහයියාව කොට්ඨාස අංක 20, මහයියාව (මහනුවර මහ නගර සභා සීමාව තුළ) ගමේ, මහයියාව (239) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් මහනුවර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංකය මහ 6747 හා 2017.01.17 දිනැති පිඹුරේ කැබලි අංක 1 සිට 3 දක්වා පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0449 ක් වූ පහත සඳහන් ඉඩම් කොටස් (03):

01. **කැබලි අංකය 1**

ඉඩමේ නම: වරිපනම් අංක 161, කටුගස්තොට පාර; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් සහ තාවකාලික ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: - (එම්. එම්. ගුණතිලක, නො. 5ඒ, ධර්මාශෝක මාවත, මහනුවර විසින් අනවසරයෙන් භුක්ති විඳී, මු. පි. 7428 හි කැබලි අංක 459 න් කොටසක් (දුම්රිය මාර්ගය සඳහා වෙන්කල බිම) සහ අංක නොයෙදූ බිම් කැබැල්ලෙන් කොටසක්); ප්‍රමාණය: හෙක්. 0.0313.

02. **කැබලි අංකය 2**

ඉඩමේ නම: වරිපනම් අංක 159, කටුගස්තොට පාර; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: - (එම්. එම්. ගුණතිලක, නො. 5ඒ, ධර්මාශෝක මාවත, මහනුවර විසින් අනවසරයෙන් භුක්ති විඳී, මු. පි. 7428 හි කැබලි අංක 459 න් කොටසක් (දුම්රිය මාර්ගය සඳහා වෙන්කල බිම) සහ අංක නොයෙදූ බිම් කැබැල්ලෙන් කොටසක්); ප්‍රමාණය: හෙක්. 0.0114.

03. **කැබලි අංකය 3**

ඉඩමේ නම: වරිපනම් අංක 161, කටුගස්තොට පාර; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම්



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: - (එම්. එම්. ගුණතිලක, නො. 5ඒ, ධර්මාශෝක මාවත, මහනුවර විසින් අනවසරයෙන් භුක්ති විඳී, මු. පි. 7428 හි අංක නොයෙදූ බිම් කැබැල්ලෙන් කොටසක්); ප්‍රමාණය: හෙක්. 0.0022.

ඉහත සඳහන් ඉඩමට / පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018.04.27 දින අනුව පෙරවරු 9.30 ට මහනුවර කඩවත්සතර සහ ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2018.04.20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත්සතර සහ ගඟවටකෝරළේ.

2018 අප්‍රේල් මස 02 වැනි දින,
මහනුවර කඩවත්සතර සහ ගඟවටකෝරළේ,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 - 683

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.